ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 අප්‍රේල් මස 30 වන දින |

## කො.පා.මි.ද මත පදනම් වූ උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ දී පහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 5.2%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.8%
- මාසික වෙනස : 0.1%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 3.1%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.7%
- මාසික වෙනස : 0.2%







කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 මාර්තු මාසයේ පැවති සියයට 5.4හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 5.2 දක්වා පහළ යන ලද අතර, මේ සඳහා 2019 අප්‍රේල් මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම පූර්ණ වශයෙන් දායක විය. මේ අතර, 2020 අප්‍රේල් මාසයේ දී ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 13.2ක් වූ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය, 2020 මාර්තු මාසයේ පැවති සියයට 2.5හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 2.1ක් දක්වා පහළ යන ලදී.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස, 2020 මාර්තු මාසයේ පැවති සියයට 4.7හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 4.8 දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී.

---
[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

ආහාර කාණ්ඩයේ අයිතමවල දක්නට ලැබුණු මිල ඉහළ යෑම හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.1ක් ලෙස වාර්තා විය. 2020 අප්‍රේල් මාසයේ දී ආහාර කාණ්ඩයෙහි පොල්, කුළුබඩු, පොල්තෙල් සහ කරවල මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා වූ අතර, එම මිල ඉහළ යෑම් තුළින් ඇති වූ බලපෑම, කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ රජය මැදිහත් වී, සහල්, පරිප්පු, ලොකු ළූණු සහ ටින් මාළු වැනි ආහාර අයිතමවල මිල අඩු කිරීම හේතුවෙන් බොහෝ දුරට සමනය විය. මේ අතර, උත්සව සමයේ ඇති වන ඉල්ලුමත් සමග සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේ දී ඉහළ යන ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිලගණන්, කොවිඩ්-19 ව්‍යාප්තියත් සමග රට වසා දැමීම හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දී නොවෙනස්ව පැවතුණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය 2020 මාර්තු මාසයේ පැවති සියයට 2.9හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 3.1ක් දක්වා ඉහළ යන ලදි. එසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 මාර්තු මාසයේ දී පැවති සියයට 4.9හි සිට 2020 අප්‍රේල් මාසයේ දී සියයට 4.7 දක්වා මාස පහක දී දක්නට ලැබුණු අවම අගය කරා පහළ යන ලදී.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 01 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජූනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව